ID 425

Major correction.

# පාරම්පරික ඇදහිල්ලක් වන වෙහෙරගල ''කෝවිල් දානය'' පිළිබඳ අධ්‍යයනයක්

කේ. ඩී. එම්. එස්. එම්. දිසානායක, එස්. ආර්. ටී. සඳමාලී

*shyalika1995@gmail.com, thilinika359@gmail.com*

## හැඳින්වීම

අභිචාර විධි යනු කිසියම් සමාජයක සම්ප්‍රදායෙන් පැවතගෙන එන සිරිත් විරිත් ඇදහිලි ක්‍රම සම්ප්‍රදායකි. එහි කාල නිර්ණයක් කිරීම අපහසුය. මන්ද, මිනිසාගේ ආරම්භයත් සමඟම අභිචාර ක්‍රම පැන නැඟී ඇති නිසාවෙනි. ජන සංස්කෘතිය තුළදී විවධ අභිචාර ක්‍රම හඳුනාගෙන ඇති අතර ඇතැම් ගම්වලට පමණක්ම ආවේණික වූ අභිචාර විධි පවතී. ඒ අනුව කෝවිල් දානය යනු විෂඝෝර සර්පයින්ගෙන් ආරක්ෂාවීම සඳහා සිදු කරනු ලබන අභිචාර ක්‍රමයකි.

## ක්‍රමවේදය

මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සම්මුඛ සාකච්ඡා මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණය සිදුකළ අතර ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය තුළදි පුස්තකාල ගවේෂණය සිදුකරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡා

අනුරධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙහෙරගල ග්‍රාමයේ දැකිය හැකි අභිචාර ක්‍රමයක් ලෙස මෙම කෝවිල් දානය පෙන්වා දිය හැකිය. මෙය පරම්පරාවෙන් පැවතගෙන එන අභිචාර ක්‍රමයක් වන අතර අදටත් එය දක්නට ලැබේ. මෙහිදි තමන් ඇතුලු පවුලේ සියළු දෙනාම සර්පයින්ගෙන් ආරක්ෂා කරදෙන ලෙස ඉල්ලා කෝවිල් අම්මා නැමති දේවතාවියට තම නිවස තුළදීම බාර වෙයි. මෙහිදී පිරිසිඳු රෙදි කඩකට හාල් ස්වල්පයක් ගැට ගසා එය කොහොඹ කෝටුවක එල්ලා සර්පයින්ගෙන් ආරක්ෂා කර දෙන ලෙස සිතින් යාතිකා කොට නිවසේ උස තැනක එල්ලයි. එම හාල් ගැටය යම් හෙයකින් කිසියම් සතෙකු විසින් හානි සිදු කරන ලද්දේ නම් ගැමියන් විශ්වාස කරනුයේ එය සර්පයින් ගෙවත්තට ඇතුලු වන නිමිත්තක් ලෙසය. එබැවින් නැවත මෙම හාල් ගැටය ඔවුන් විසින් අලුත් කරනු ලැබේ. ඔවුන් කෝවිල් අම්මා වෙනුවෙන් මෙම බාරහාර ඔප්පු කරනු ලබන්නේ අළුත් අවුරුදු මාසයේ පරණ අවුරුද්ද දවසේ උදෑසනදී ය. එදින නිවසෙහි මසාමාංශ පිසීමෙන් වළකින අතර සෑම නිවසකම කෝවිල් අම්මා වෙනුවෙන් බතක් සහ පරිප්පු ව්‍යංජනයක් සකසා එම ව්‍යංජනයට මුරුංගා කොල එකතු කරයි. මෙසේ පිසගත් දානය පිඟන්වලට බෙදා මේසයට අරින අතර, මේසය මත පොල්තෙල් පහනක් දල්වයි. ඉන්පසු කෝවිල් අම්මාට දානය පිළිගැන්වීම සිඳු කරයි. එහිදී පිරිසිදු වතුර වීදුරුවක් ගෙන පිඟන් වලට බෙදු දානෙන් කුඩා කොටසක් එම වතුර වීදුරුවට දමා එය කොහොඹ කිනිත්තක් එයට දමයි. ඉන්පසු සර්පයින් තම ගෙවත්තට ඇතුලු නොවෙන ලෙස ඉල්ලා කෝවිල් අම්මාට යාතිකා කොට වීදුරුවහි ඇති දානය වත්ත පුරාවටම ඉසිනු ලබයි. ඉන් අනතුරුව පිඟන්වලට බෙදු දානය අසල් වැසියන්ට බෙදා දෙන අතර ඔවුන් එම දානයට වැද

- Remove sub titles

ID 425

නමස්කාර කොට ආහාරයට ගනියි. ඉන්පසුව නිවසේ පිරිස් දානය අනුභව කිරීමෙන් පසු බාර ඔප්පු කිරීම අවසන් වේ.

සාරාංශය

අභිචාර ක්‍රම මිනිස් වර්ගයාගේ පැවැත්මත් සමඟ ආරම්භ වුවත් එය අදවන තෙක්ම පැවතගෙන එනු ලබයි.

ප්‍රමුඛ පද - අභිචාර, සර්පයින්, කෝවිල් අම්මා, පාරම්පරික